# PROTECTIVE SERVICES OFFICER



**VICTORIA POLICE** (වික්ටෝරියා පොලීසිය) මගින් **PROTECTIVE SERVICES OFFICER (PSO)** වශයෙන් කටයුතු කිරීම සඳහා අයව බලමින් සිටී.

## PSO විසින් කරන්නේ කුමක්ද?

දුම්රිය ජාලය භාවිතා කරන 400,000 ක් වන මගීන්ව ආරක්‍ෂා කිරීම සඳහා වික්ටෝරියාව පුරා දුම්රිය ස්ථානවල පව 6 සිට පෙව 3 දක්වා PSOව රඳවා තබා ඇත. PSO පහත කරුණු සඳහා වගකිව යුතුවේ:

- සක්‍රීය ආකාරයට දුම්රිය මගීන්ව බලා ගන්නා අතර ඔවුන් සිටින බව අනෙක් අයට පෙනෙන සේ පවත්වා ගැනීම
- මහජනතාවගේ සාමාන්‍ය විමසීම් සම්බන්ධයෙන් උපකාර කිරීම
- උපදෙස් ලබාදීම සහ ප්‍රජාව ආරක්‍ෂාකාරීව සිටින බවට වගබලා ගැනීම
- මධ්‍යසාර, මත්ද්‍රව්‍ය ආදියට අදාල අපරාධ සහ දේපළවලට හානි කිරීම ඇතුළු සමාජ විරෝධී හැසිරීම් සම්බන්ධ සිදුවීම් අදාලව කටයුතු කිරීම

VICTORIA POLICE

## මා PSO කෙනෙකුවීමට සුදුසුකම් ලබයිද?

Victoria Police හි PSO කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට සුදුසුකම් ලැබීම සඳහා පහත සුදුසුකම් සපුරාලිය යුතුය:

**ඕස්ට්‍රේලියානු පුරවැසිකම හෝ ඕස්ට්‍රේලියානු ස්ථිර වාසිකත්වය තිබීම**
Victoria Police වෙත බැඳීමට ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ඕස්ට්‍රේලියානු ස්ථිර වැසියෙකු විය යුතුය.

**හොඳ චරිතයක් සහ කීර්තියක් තිබිය යුතුය**
තෝරා ගැනීමේ කාර්යාවලියේදී Victoria Police මගින් Protective Services Officer අයදුම්කරුවන් සම්බන්ධ විස්තරාත්මක පසුබිම් පරීක්‍ෂා සිදු කෙරේ. Victoria Police හි පූර්ව ඉතිහාස මාර්ගෝපදේශ සම්බන්ධ වැඩි විස්තර සඳහා www.policecareer.vic.gov.au/pso/forms-pso වෙබ් අඩවිය වෙත යන්න.

**අවම වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය**
අදාල තනතුරේ වැඩ කිරීම සඳහා Victoria Police හි වෛද්‍ය ප්‍රතිපත්තියට අනුව අවම වෛද්‍ය අවශතාවයන් සපුරා ලිය යුතුය. Victoria Police හි වෛද්‍ය මාර්ගෝපදේශ සම්බන්ධ වැඩි විස්තර සඳහා www.policecareer.vic.gov.au/pso/forms-pso වෙබ් අඩවිය වෙත යන්න.

**හොඳ ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා ඇති බව දැක්වීම**
PSO කෙනෙකු වශයෙන් ඔබ විසින් පෙන්විය යුතු මූලික කුසලතාවයක් වන්නේ ඔබට හොඳින් ඉංග්‍රීසි කථාකල හැකි බවය. මෙයින් අදහස් වන්නේ මෙහෙයුම් තත්ව යටතේ තනතුරේ රාජකාරි ඉතා හොඳින් කල හැකි මට්ටමට කියවීමේ, ලිවීමේ, සවන්දීමේ සහ කථා කිරීමේ හැකියාව ඇති බවය.

සටහන: මහජනතාවට සිය මව් භාෂාවෙන් කථාකර නැවත ඉංග්‍රීසි භාෂාවෙන් තොරතුරු ලබාදිය හැකි, භාෂා දෙකක් කථාකල හැකි අය සම්බන්ධයෙන්ද Victoria Police විශේෂ උනන්දුවක් දක්වයි.

**වයස අවුරුදු 21ට අඩුනම්, අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම**
ඔබට වයස 21ට වඩා අඩුනම්, පුහුණුව පටන් ගැනීමට පෙර වික්ටෝරියානු අධ්‍යාපන සහතිකය (Victorian Certificate of Education (VCE)) හෝ සමාන සුදුසුකමක් (ව්‍යවහාරික ඉගෙනීම සම්බන්ධ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වික්ටෝරියානු සහතිකය (Senior Level Victorian Certificate of Applied Learning (VCAL)) පිළිගනු ඇත) සමත්ව තිබිය යුතුය.

**වික්ටෝරියානු රියදුරු බලපත්‍රයක් තිබීම**
පුහුණුව කරන අවස්ථාවේදී වලංගු වික්ටෝරියානු රියදුරු බලපත්‍රයක් ඔබ සතුව තිබිය යුතුය. ඔටෝමැටික් (automatic) හෝ මැනුවල් (manual) රියදුරු බලපත්‍රයක් පිළිගත හැකිය.

## PSO කෙනෙකු වීමට අයදුම් කිරීමට පෙර මා විසින් වෙනත් කුමන වැදගත් තොරතුරු සැලකිල්ලට ගත යුතුද?

- PSO කෙනෙකු වශයෙන් සති දෙකකට පැය 80ක් පාන්දර වැඩමුළුවල ස්ථිර පදනමකින් කටයුතු කල යුතුය (ආරම්භ කරන වේලාව පව 3 සිට පව 7 වන අතර අවසන් කරන වේලාව පෙව 2 සහ පෙව 3 අතරවේ)
- PSO කෙනෙකු වශයෙන් ඔබ ගැටුම්වලට මුහුණ දෙන අතර, හිංසාකාරී අය සහ මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාරවල බලපෑම ඇති අය සමග කටයුතු කිරීමට සිදුවේ
- PSO කෙනකු වශයෙන් ප්‍රාන්තයේ නීතිය ආරක්ෂා කිරීම සඳහා සිය පුද්ගලික, ආගමික සහ දේශපාලන මත පසෙක තබා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ
- PSO කෙනකු වශයෙන් ඔබ ගිනි අවියක් රැගෙන යා යුතුය
- PSO කෙනකු වශයෙන් ඔබ රාජකාරියේ සිටින විට සහ රාජකාරියෙන් බැහැරව සිටින විට ඔබගේ ක්‍රියා කලාපයෙන් ඔබව සහ Victoria Police නිරූපණයවේ. මෙම ක්‍රියා කලාපය ඉහළ මට්ටමක තිබිය යුතු අතර Victoria Police හි වටිනාකම් නිරූපණය කල යුතුය
- PSO කෙනකු වශයෙන් ඔබට රාජකාරියට යැමට සහ රාජකාරි අවසන් කර යාමට පුද්ගලික වාහනයක් තිබිය යුතුය. මෙයට හේතුව ඔබ ඔබගේ වැඩ මුරය අවසන් කරන විට පොදු ප්‍රවාහන සේවා අවසන්ව තිබීමයි
- PSO කෙනකු වශයෙන් ඔබගේ පුහුණුවෙන් පසු ඔබ රාජකාරී කිරීමට කැමති ප්‍රදේශ මොනවාද යන්න කීමට අවස්ථාවක් ලබාදේ, කෙසේ වුවද මෙය තීරණය වන්නේ ඉඩකඩ ඇති ආකාරයටය

## PSO කෙනෙකු සම්බන්ධ අයදුම්පත් ක්‍රියාවලිය කුමක්ද?

අයදුම්කරුවකු වශයෙන්, Victoria Police හි සේවයට බඳවා ගැනීමට තෝරා ගැනීමට පෙර පහත පියවරවල් සමත්විය යුතුය:

| | |
|---|---|
| පියවර 1 | www.policecareer.vic.gov.au ඔස්සේ මාර්ගගතව අයදුම්පතක් යොමු කිරීම |
| පියවර 2 | විභාගයකට පෙනී සිටීම |
| පියවර 3 | ප්‍රාථමික පසුබිම් පරීක්ෂාවන්වලට මුහුණ දීම |
| පියවර 4 | ශාරීරික යෝග්‍යතා පරීක්ෂාවන්වලට මුහුණදීම |
| පියවර 5 | මානසික යෝග්‍යතා පරීක්ෂාවන්ට මුහුණදීම |
| පියවර 6 | වෛද්‍ය පරීක්ෂාවන්ට මුහුණදීම |
| පියවර 7 | සවිස්තරාත්මක පසුබිම් පරීක්ෂාවකට මුහුණදීම |
| පියවර 8 | කණ්ඩායම් සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම |

## PSO තනතුරෙහි ඇති වැටුප් සහ ප්‍රතිලාභ මොනවාද?

- පුහුණුව ලබා දෙන පළමු දින සිට තරඟකාරී මූලික වේතනයක්
- වාර්ෂික වැටුප් වැඩිවීම් සහ අමතර මුර දීමනා
- සති 9ක නිවාඩු (සති 5ක විශ්‍රාන්ති නිවාඩු, රජයේ නිවාඩු දින වෙනුවෙන් සති 2ක නිවාඩු සහ දින 10ක් සඳහා එකතුවූ නිවාඩු ඇතුළුව)
- ආරක්ෂක හමුදා නිවාඩු
- නිල ඇඳුම් ලබාදේ
- රැකියාවේ සුරක්ෂිතබව

## PSO කෙනෙකු වශයෙන් මට ලැබෙන පුහුණුව කුමක්ද?

අපගේ සියළුම PSO හට පහත ආකාරයට Victoria Police සමඟින් රැකියාව කරන පළමු මාස 6 ඇතුලත පුහුණුවක් ලැබේ:

- 1 සිට 12 වන සතිය තෙක්: Victoria Police ඇකඩමියෙහි නීතිය, සන්නිවේදන කුසලතා සහ මෙහෙයුම් ආරක්ෂාව සම්බන්ධ පුහුණුව (ගිනි අවි පුහුණුව ඇතුළු)
- 13 සිට 24 සතිය තෙක්: උපදේශකයෙකු (mentor) සමඟින් මෙල්බර්න් CBD දුම්රිය ස්ථානයක පුහුණුව

### තවදුරටත් විස්තර අවශ්‍යද?

සෑම සතියකම Victoria Police මඟින් මෙල්බන් පුරා PSO තොරතුරු සැසි පවත්වනු ඇත.

දින සහ වේලාවන් බලා ගැනීම සඳහා www.policecareer.vic.gov.au/pso/info-session වෙබ් අඩවිය වෙත යන්න.

### නැතිනම්

ඔබගේ විමසීම rsbmarketing@police.vic.gov.au වෙත යොමු කරන්න.

VICTORIA POLICE